# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2119/14 – 2019 අප්‍රේල් 18 වැනි බ්‍රහස්පතින්දා – 2019.04.18**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/E/2015/169(A).

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරිය**

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2018.03.14 දිනැති හා අංක 2062/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2018.03.08 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කඩවත, මහර, එළිසබෙත් පෙරේරා මාවත, අංක. 130/13/1 හි පදිංචි ඩබ්. එල්. පී. ඉමාලි මහේෂණී මිය ඇතුළු සේවකයින් 13 දෙනා හා අනෙක් පාර්ශවය වශයෙන් කොළඹ 03, ගාලු පාර, අංක. 80 හි පිහිටි ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2019.01.18 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 අප්‍රේල් මස 04 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05

1A – G 29900 – 13 (2019/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

නාරාහේන්පිට කාර්මික අධිකරණයේ දී ය.

ඩබ්. එල්. පී. ඉමාලි මහේෂනී මිය ඇතුළු සේවකයින් 13 දෙනා, 130/13/1, එළිසබෙත් පෙරේරා මාවත, මහර, කඩවත

ඉල්ලුම්කරුවන්
සහ

බේරුම්කරණ අංක : 3635
නව අංකය: ඒ/12/2018
IR/COM/04/E/2015/169(A)
*දෙවන පාර්ශවය,*

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, අංක 80, ගාළු පාර, කොළඹ 03.

වගඋත්තරකාර පාර්ශවය

*ප්‍රදානය.*

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය වේලාතන්ත්‍රීගේ දොන් ජෝන් සෙනෙවිරත්න ගරු අමාත්‍යතුමාගේ 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) (පනත සමග කියවා) පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2018.03.08 දින මා පත් කොට මා වෙත යොමු කොට ඇත.

වර්ෂ 2018.02.20 දිනැති කම්කරු කොමසාරිස් ජනරාල්තුමාගේ යොමුව පහත පරිදි දැක්වේ.

"ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ සේවය කළ ඩබ්. එල්. පී. ඉමාලි මහේෂනී මහත්මිය ඇතුළු පහත නම් සඳහන් සේවකයින් 13 දෙනාගේ තනතුරු අහෝසි කිරීම යුක්ති සහගත ද යන්න එලෙස යුක්ති සහගත නොවන්නේ නම් ඔවුන් එකිනෙකාට හිමි සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.

01. ඩබ්. එල්. පී. ඉමාලි මහේෂනී
02. ටී. එන්. විතාරණ
03. එන්. ඒ. ශ්‍රීයාසිංහ
04. කේ. බී. බී. ප්‍රනාන්දු
05. පී. ඒ. මධුෂානි පින්නවල
06. එච්. ලක්ෂානි වීරතුංග
07. ඩී. පී. දිසානායක
08. වී. කේ. ඩී. බණ්ඩාර
09. එස්. එස්. ආර්. බී. ඩී. ජී. එස්. ජයවර්ධන
10. බී. ඒ. සී. මාලින්ද
11. එස්. ඒ. එන්. ඩබ්. සමරකෝන්
12. එස්. එච්. එම්. ආර්. ආර්. ඩබ්. ටී. ඒ. සමරදිවාකර
13. දර්ශිකා හෙට්ටිආරච්චි යන අය වේ."

මෙහි සඳහන් යොමුව ගරු ආමාත්‍යතුමා විසින් 2016.03.15 දින ටී. ඒ. සාන්තරාජන් බේරුම්කාරතුමා වෙත යොමු කරන ලදුව, එය අඩක් විමසීමෙන් අනතුරුව ඒ මහතා පෞද්ගලික කරුණක් මත බේරුම්කරණ නඩු අංක ඒ - 3635 ඉවත් වීමෙන් අනතුරුව මා වෙත පවරා ඇත.

නඩු අංක 3635 යටතේ 2016.04.26 දින පූර්වගාමී බේරුම්කාර සාන්තරාජන් මහතා නඩු විභාගය ආරම්භ කොට ඇත. පළමු පාර්ශවය වෙනුවෙන් නීතිඥ එච්. ඒ. සෙනෙවිරත්න මහතා පෙනී සිටි අතර වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් නීතිඥ ඉනෝකා පුංචිහේවා මිය පෙනී සිටිමින් පළමු පාර්ශවයේ ප්‍රකාශ භාර දී තිබිණ. යොමුවේ ඉල්ලුම්කරුවන් 13 දෙනෙකු ඇතුළත්ව ඇතත් විභාගය අතරතුර එය සංඛ්‍යාවකට සීමා කොට ප්‍රදානය ලබා දිය යුතු බැව් නඩුවේ දෙපාර්ශවය පිළිගෙන ඇත. එනම්, 2018.08.29 දිනැති කාර්ය සටහන් අනුව සහන අයැද සිටින ඉල්ලුම්කරුවන් වනුයේ,

1. ඩබ්. එල්. පී. ඉමාලි මහේෂනී
2. එච්. ලක්ෂානී වීරතුංග
3. වී. කේ. සී. බණ්ඩාර
4. ටී. එන්. විතාරන
5. එන්. ඒ. ශ්‍රීයාසිංහ යනාදීහු වෙති.

ප්‍රථමයෙන් 2016.09.21 දින වගඋත්තරකාර පාර්ශවය තම නඩුව ඉදිරිපත් කරමින් සාක්ෂි මෙහෙයවා ඇත. ඉල්ලුම්කරුවන් වෙනුවෙන් නියෝජිත ලංකා ලෝක මහතා පෙනී සිටි අතර වගඋත්තරකාර දෙවන පාර්ශවය වෙනුවෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥ දිවිත්‍රා විතාරණ මෙනවිය ද පෙනී සිටින ලදී.

වගඋත්තරකරුගේ සාක්ෂිකාර තල්ගස් දූවගේ නිල්මිණි රේනුකා මිය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ කණිෂ්ඨ කළමනාකාර සාක්ෂි දෙමින් තමා ආයතනයේ බඳවා ගැනීම් සම්බන්ධව කටයුතු කරන බවත්, මානව සම්පත් අධ්‍යක්ෂකගේ පෞද්ගලික සහකාර ලෙස ද, කටයුතු කරන බව ද තම සම්පූර්ණ සේවා කාලය අවුරුදු 18 ක් වන බවත් ඉන් අවුරුදු 08 ක්ම බඳවා ගැනීම් පිළිබඳ පළපුරුද්ද පවතින බවත් සාක්ෂාත් කළ අතර,

තම ආයතනයේ බඳවා ගැනීමේ පටිපාටිය අනුව පුවත්පත් දැන්වීමක් මත අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණයක් මත වැඩිපුර ලකුණු ලබා ගත් අය ආයතනයට බඳවා ගැනීම සඳහා තෝරා ගෙන අධ්‍යක්ෂ මණ්ඩලයට දැන්වීමෙන් පසුව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට පසුව අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගෙන පත්වීම් ලබාදීමට කටයුතු කරන බව සාක්ෂි මගින් තහවුරු කොට ඇත.

ඉල්ලුම්කාර පාර්ශවයේ කළමනාකාර සහකාරවරු 08 ක්ද, කාර්යාල කාර්ය සහායක 04 ක් ද, එක් රියදුරු තනතුරක් ද, සහිතව 13 දෙනෙකු බඳවා ගැනීම මත මෙම බේරුම්කරණ නඩු විභාගය පවත්වන බව ද,

මෙම සේවකයින් 13 දෙනා බඳවා ගැනීම සම්බන්ධව පුවත්පත් දැන්වීමක් පළ නොකළ බවත්, සම්මුඛ පරීක්ෂණයක් නොපැවැත්වූ බවත් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් යොමු නොවූ බවත්, 2011 ජනාධිපතිවරණයට පෙර මෙම බඳවා ගැනීම් සිදු වූ බවත් සාක්ෂාත් කළා ය.

මැතිවරණ චක්‍රලේඛන ඡායා පිටපත් බැවින් ඒවා ඔප්පු කිරීමේ භාරයට යටත්ව ඉදිරිපත් කිරීමට අධිකරණය අවසර දී ඇත. එකී ලේඛනය ආර්1 ලෙස සළකුණු කොට ඇත.

ජනාධිපතිවරණය 2015 ආර්02 දරන ලේඛනය එනම් රජයේ හා රාජ්‍ය සංස්ථා ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අයත් දේපල ජනාධිපතිවරණ කාල සීමාව තුළ දී අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම සහ ජනාධිපතිවරණ කාල සීමාව තුළ දී නිලධාරීන්, සේවකයින් බඳවා ගැනීම, උසස් කිරීම, මාරු කිරීම සීමා කිරීම ඉදිරිපත් කර ඇත.

ඉහත සාක්ෂිකාරිය ඉල්ලුම්කාර පාර්ශවය වෙනුවෙන් හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් මෙසේ ප්‍රකාශ කර සිටින්නීය.

I. පළමු පාර්ශවයට පත්වීම් ලිපි 2014.11.03 දින ලබා දුන් බව

II. ඔවුන් වැඩ භාර ගෙන ඇත්තේත්, පැමිණීමේ ලේඛනයේ 2014.11.24 දින අත්සන් කොට වැඩ භාර ගෙන ඇති බවත්,

III. පළමු පාර්ශවයේ සේවකයින් 13 දෙනා ඉවත් කළ බවත් පසුව නවක බඳවා ගැනීම් කළ බවත් (කාර්ය සටහන් පිටු අංක 113)

IV. පළමු පාර්ශවයේ සේවකයින් 13 දෙනා වෙත දෙවන පාර්ශවය විසින් ලබා දී ඇති පත්වීම් ලිපිවල කාර්යාල පිටපත, (කාර්ය සටහන් 0192 පිටුව)

V. එකී 13 දෙනා වෙත පත්වීම් ලත් දින සිට දෙවන පාර්ශවය ගෙවන ලද වැටුප් වාර්තා

VI. එකී සේවකයින් 13 දෙනා සේවය අවසන් කිරීමේ ලිපිවල කාර්යාල පිටපත්

VII. එකී සේවකයින් 13 දෙනා බඳවා ගැනීම සඳහා ඇබෑර්තු ප්‍රසිද්ධ කළ පුවත්පත් දැන්වීම්

VIII. ඉහත සේවකයින් විසින් ලබා දුන් දිවුරුම් සියල්ල ඉල්ලා ඇතත් ප්‍රසිද්ධ දැන්වීම් පළ නොකළ බව සාක්ෂිකරු, සඳහන් කොට ඇත. (කාර්ය සටහන් පිටුව 0192)

2017.02.01 දින සාක්ෂි සඳහා කැඳවන ලද තල්ගස් දූවගේ නිල්මිණි රේණුකා නමැති කණිෂ්ඨ කළමනාකාරිය තවදුරටත් සාක්ෂි ලබා දෙමින් මෙසේ ප්‍රකාශ කොට ඇත.

A01 දරන විදානෙලාගේ කපිල දේවප්‍රිය බණ්ඩාර මහතාගේ (ඉල්ලුම්කාර පාර්ශවයේ) පත්වීම් ලිපිය සලකුණු කොට ඉදිරිපත් කරමින් එකී ලිපිය 2014.11.03 වන දින එය එදින සිට ක්‍රියාත්මක බවත් සාක්ෂිකාරිය කියා සිටී.

තවදුරටත් පත්වීම් දෙන විට ගන්නා ක්‍රියාපටිපාටිය පැහැදිලි කරමින් ඇය මෙසේ කියා ඇත. (කාර්ය සටහන් පිටුව 0202)

(අ) ආයතනයේ පුරප්පාඩුවක් පවතින විට ප්‍රථමයෙන් අභ්‍යන්තර සේවකයින්ගෙන් අයදුම් කර පුරප්පාඩු පුරවන බවත් එසේ අභ්‍යන්තර සේවකයින් කිසිවෙක් නොපවත්නා විටක පුවත් පත් දැන්වීමක් පළ කොට බාහිර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවා, සම්මුඛ පරීක්ෂණයක් මඟින් පුරප්පාඩු පුරවන බවත්, ඒ සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් සුදුස්සන් තෝරා ගන්නා බවත් ඔවුනට පත්වීම් ලිපි භාර දෙන බවත් සාක්ෂියේදී අනාවරණය කොට ඇත. එහෙත් මෙම බේරුම්කරණයේ ඉල්ලුම්කරුවන් 13 දෙනා ගැන තොරතුරු තමන් නොදන්නා බවත් කියා ඇත.

A01 දරන පත්වීම් ලිපියේ පිටපත්

A. ලේකම් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

B. අධ්‍යක්ෂ මූල්‍ය කළමනාකරු

C. අධ්‍යක්ෂ මානව සම්පත් හා පරිශ්‍ර කළමනාකරු

D. අධිකාරී රජයේ විගණන

E. අභ්‍යන්තර විගණන

F. නිවාඩු ලිපිකරු

G. පෞද්ගලික ලිපිගොනුව යන අය වෙත යොමු කොට පවතින බවට සාක්ෂි දී ඇත.

තවදුරටත් සාක්ෂිකාර නිල්මිනි රේණුකා මිය සාක්ෂි දෙමින් (කාර්ය සටහන් 0218 පිටුව) මෙම ඉල්ලුම්කරුවන්ගේ සේවය අවසන් කළේ 2015 පැවති ජනාධිපතිවරණයෙන් පසුව බවත් පසුව නව සේවකයින් කිහිපදෙනෙකු බඳවා ගත් බවත් ඒ සඳහා පුවත්පත් දැන්වීමක් පළ නොකළ බවත් සාවද්‍ය ක්‍රියා පටිපාටියක් අනුව නව බඳවා ගැනීම් කළ බවත්

2015 මැයි මාසයේ අනියම් කාර්යාල කාර්ය සහායකයින් 08ක් ද වේටර් කාමරකරු 04ක් ද රියදුරන් 02ක් ද එම වර්ෂයේම අගෝස්තු මාසයේ කළමනාකාර සහායකයින් 14ක් හා රියැදුරන් 01ක් ද බඳවා ගත් බවට සාක්ෂාත් කළාය. (කාර්ය සටහන් පිටු 0255 සහ 0226) ඉහත ඉල්ලුම්කරුවන් සේවයෙන් ඉවත් කිරීම සම්බන්ධව තොරතුරු තමා නොදන්නා බවත් හෙළි කරන්නට වී ඇත.

මෙම සාක්ෂිකාරිය තවදුරටත් ඉල්ලුම්කාර පාර්ශවය 13 දෙනා කැඳවා පත්වීම් ලබාදීම සහ ඉවත් කිරීම සම්බන්ධව කිසිවක් නොදන්නා බව (කාර්ය සටහන් 0231 පිටුව) ප්‍රකාශ කර සිටී.

වගඋත්තරකරුවන්ගේ මීලඟ සාක්ෂිකරු වන මිහිර උදයංග ලියනාරච්චි මහතා සාක්ෂි දෙමින් මෙසේ පවසා ඇත.

01. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ පළ කරන ලද ඇබෑර්තු සඳහා සිංහලෙන් පළ කරන ලද දැන්වීම R4(S) ලෙස ද ඉංග්‍රීසි පුවත්පත් දැන්වීම R4(E) ලෙස ද සලකුණු කොට ඉදිරිපත් කරන ලද බවත්,
02. ඉල්ලුම්කරුවන් අත්සන් කරන ලද පැමිණීමේ ලේඛන 2011.11.24 සිට 2011.12.08 දක්වා කාලයට අදාළ ලේඛන R5(P) ලෙස සලකුණු කර ඉදිරිපත් කරන බවත්, (කාර්ය සටහන් පිටු අංක 0299)
03. වී. කේ. ඩී. බණ්ඩාර නමැති ඉල්ලුම්කරු සේවයට වාර්තා කළ දිනය 2014.11.24 බවත් කියා සිටී.
04. පළමු පාර්ශවයට වැටුප් ගෙවීමේදී දෛනික වැටුප් වශයෙන් ගණන් බලා ගෙවූ බව, මෙම සාක්ෂිකරු 2017.07.10 දින හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් පවසා ඇත.
05. පළමු පාර්ශවකරුවන්ගේ සේවය අවසන් කොට දෙවන පාර්ශවය ආයතනයට සේවකයින් බඳවා ගත් බව (කාර්ය සටහන් පිටු අංක 0331 පිටුව)
06. ඉල්ලුම්කරුවන් 13 දෙනා බඳවා ගන්නා විට තමා මානව සම්පත් අංශයේ ප්‍රධානියා ලෙස කටයුතු කළ බවත්, මෙම බඳවා ගැනීම් තමාගේ හිතට විරුද්ධව සිදු කළ බව,
07. තමාගේ හිතට එකඟ නොවන පරිදි සිදු කරන මෙම ඉල්ලුම්කරුවන් 13 දෙනාට පත්වීම් දීම අවිධිමත් පත්වීම් බව.
08. මෙම අවිධිමත් පත්වීම් සම්බන්ධව තමා නියෝජ්‍ය කම්කරු කොමසාරිස්තුමාට දැන් වූ බවත්,
09. වී. කේ. ඩී. බණ්ඩාර නමැති ඉල්ලුම්කරු වෙත පත්වීම් ලිපියක් නිකුත් කොට ඇති බවත්, (කාර්ය සටහන් පිටු 0335)
10. A01 දරන ලේඛනය එනම් බණ්ඩාර නමැති ඉල්ලුම්කරුගේ පත්වීම් ලිපිය තමා සකස් කළ බවත්,
11. ඉල්ලුම්කරුවන් 13 දෙනාටම පත්වීම් ලිපි පත්වීම් බලධාරියා වන ආයතනයේ සභාපතිගේ අත්සනින් සකස් කළ බවත්,
12. රාජ්‍ය පාරිපාලන චක්‍රලේඛන පරිදි මෙම ඉල්ලුම්කරුවන්ගේ වැටුප් ගණනය කළ බවත්,
13. පළමු පාර්ශවකරුවන්ගේ පත්වීම් අහෝසි කළ බවත් "B3" නමැති ලේඛනයෙන් එය ඔප්පු වන බවත්,
14. ජනාධිපතිවරණයට නාම යෝජනා දැන්වීම් පළ කළ 2014.11.21 සිට ජනාධිපතිවරණය පවත්වා ප්‍රතිඵල නිකුත් කොට අවසන් වනතුරු ජනාධිපතිවරණ විමසීම් කාලයට අයත්වන බැවින් එකී කාලය තුළ පත්වීම් දෙන්නේ අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය මත පමණක් බව, වගඋත්තරකාර ආයතනයේ සාක්ෂිකරු පැහැදිලි කර සිටියේ ය. වගඋත්තරකරුගේ නඩුව මෙතෙකින් අවසන් කරන ලදී.

මීළඟට ඉල්ලුම්කාර විජේතුංග ලියන පටබැඳිගේ ඉමාලි මහේෂනී යන අය සාක්ෂියට කැඳවන ලදුව ඇයි විසින්,

01. තමාට PF(B) PC 2014.11.03 දිනැති පත්වීම් ලිපිය ලැබුණු බවත් ඒ අනුව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ පත්වීම් ලද බවත්, B2 දරන ලේඛනය මත පත්වීම අහෝසි වූ බවත්,
02. එසේ අහෝසි කිරීමට හේතුවක් සඳහන් නැති බවත්,
03. එසේ අහෝසි කිරීම අසාධාරණ හා අයුක්ති සහගත බව තමා දන්නා බවත් (කාර්ය සටහන් 0392)
04. හිඟ වැටුප් සහිත රැකියාව තමා අයැද සිටින බවත් සාක්ෂි දෙමින් ප්‍රකාශ කළා ය.

වගඋත්තරකාර පාර්ශවයේ හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් මෙම සාක්ෂිකාරිය 2014.11.24 දින සේවයට වාර්තා කළ බවත්, එදින සිට වැටුප් ලැබූ බවත්, ප්‍රකාශ කළ අතර වගඋත්තරකාර පක්ෂයේ හරස් ප්‍රශ්නවලට ඇය පිළිතුරු දෙමින් සිය පත්වීම් ලිපිය 2014.11.19 දින අත්සන් යොදා භාරගත් බව ද, 2014.11.24 දින සේවයට වාර්තා කළ බවත් සඳහන් කළාය.

මෙසේ සාක්ෂි විමසීමෙන් පසුව පූර්වගාමී බේරුම්කරු වන ටී. ඊ. සාන්තරාජන් මහතා පෞද්ගලික කරුණක් මත ඒ-3635 දරන බේරුම්කරණ නඩුවෙන් ඉල්ලා අස්විය. ඉන්පසුව එකී බේරුම්කරණ විභාගය ගරු කම්කරු වෘත්තිය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය ඩබ්. ඩී. ජේ. සෙනෙවිරත්න මැතිතුමා විසින් 2018.03.08 වන දින මා වෙත පවරා පත් කොට ඇත.

යොමුව පෙර පරිදිම පැවති අතර පූර්වගාමී බේරුම්කාර සාන්තරාජන් මහතා 2017.09.29 වන දින පෙ. ව. 10.00 ට මෙම නඩුව කැඳවමින් 2016.03.13 වන දින තමා වෙත පවරන ලද නඩුවෙහි සිංහලෙන් "තනතුර අහෝසි කිරීම" හා ඉංග්‍රීසි පිටපතෙහි ''Abolishment of the Posts'' යන්න ද, එසේ පරස්පර විරෝධී බවක් පෙනෙන හෙයින් ඒ සම්බන්ධයෙන් පාර්ශවයන්ට අදහස් පළ කිරීමට ඉඩ දී ඇත. දෙපාර්ශවයෙන් ලිඛිත දේශන කැඳවා ඇත.

2016.02.29 දිනැති පූර්වගාමී බේරුම්කාරතුමා වෙත කරන ලද යොමුවේද, 2018.02.20 දිනැති මා වෙත යොමු කරන ලද යොමුවේද, "13 දෙනාගේ තනතුර අහෝසි කිරීම" ''the abolishment of the posts of the 13 employers'' යනුවෙන් සඳහන්වීම සම්බන්ධව තර්කයක් හෝ පරස්පර විරෝධීබවක් හෙළි නොවන බව මගේ හැඟීමයි. Abolish යන්නට අහෝසි කිරීම හෝ අවලංගු කිරීම යන අර්ථයේ ගත හැකිය. මේ අනුව යොමුවෙහි යම් දුර්වලතාවයක් මට නොපෙනේ. දෙවන පාර්ශවයේ ලිඛිත දේශන සමග ඉදිරිපත් කරන ලද X2 නමැති ලේඛනයේ ශීර්ෂය හා ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අනියම් කළමනාකරණ සහකාර තනතුර <u>අහෝසි කිරීම</u> යන්නෙන් සඳහන් වේ. අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් ඉමාලි මහේෂනී මිය වෙත නිකුත් කරන ලද 2015.01.20 දිනැති ලිපියේ ද, තනතුර <u>අහෝසි කිරීම</u> යන්නෙන් සඳහන් වී ඇත. ඒ සම්බන්ධව දෙපාර්ශවයම අවිවාදයෙන් පිළිගෙන ඇත.

2018.05.04 දින දෙවන පාර්ශවය විසින් ගෙනෙන ලද මූලික විරෝධතාවය වන "1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනතේ 31 (ආ) (1) උපවගන්තිය ප්‍රකාරව මෙම බේරුම්කරණ නඩුව පවත්වාගෙන යාමට පළමු පාර්ශවයට ශක්නුතාවයක් නොමැති බව කියා සිටී.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සඳහා කළමනාකරණ සහකාර තනතුර 08 ක්, කාර්යාල කාර්ය සහායක තනතුරු 04 ක්, රියදුරු තනතුරු 01 ක් ද, 2014 නොවැම්බර් මාසයේ බඳවා ගත් බැව් දෙවන පාර්ශවය පිළිගනී.

දෙවන පාර්ශවයේ ලිඛිත දේශනයෙහි (එනම් 2018.05.04 දිනැති) 4 සහ 5 වන ඡේදයන්හි බඳවා ගැනීම හා බඳවා ගත් දිනයන් සඳහන් වේ. තව ද, 6 වන ඡේදය මත වැටුප් ගෙවීම සම්බන්ධව විස්තර ද,

7 වන ඡේදය අනුව - අධිකාරියට සේවකයින් බඳවා ගැනීමේදී පුවත්පත් දැන්වීම් පළ කිරීම - අයදුම්පත් කැඳවීම, සම්මුඛ පරීක්ෂණ මගින් සුදුස්සන් තෝරා ගැනීම, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත, බඳවා ගැනීම් සිදු කළයුතු බව දක්වා ඇත. මෙම ඉල්ලුම්කරුවන් සම්බන්ධයෙන් කිසිඳු පටිපාටියක් අනුගමනය නොකළ බවත් දෙවන පාර්ශවය කියා සිටී.

එසේ සිදු කිරීම නැතහොත් අනුගමනය කළ යුතු නිසි විධිවිධාන, රෙගුලාසි හා උපදෙස් පිළිනොපැද හිතු මතයට බඳවා ගැනීමට අධ්‍යක්ෂවරු හා අනිකුත් ඉහළ නිලධාරීන් ඉඩ ලබා දීම කොතරම් වරදක් දැයි කිව හැකි ද? ආයතනයේ සභාපතිතුමාගේ කැමැත්ත මත පමණක් පත්වීම් ලබාදීම අන්‍ය සාමාන්‍යාධිකාරී හා විධායක නිලධාරීන් ව්‍යංගයෙන් එකී පත්වීම් අනුමත කළා වත්දැයි සිතේ. එසේ වැරදි ලෙස බඳවා ගන්නා ලද ඉහත කී සේවකයන් සේවයෙන් ඉවත් කිරීම ද, බලහත්කාරයෙන් කළ ක්‍රියාවක් බැව් පෙනේ.

වගඋත්තරකාර ආයතනය දෙවන පාර්ශවයේ 2018.05.04 දිනැති ප්‍රකාශයෙහි 05 වන ඡේදය අනුව මෙම නඩුවේ පළමු පාර්ශවය වෙත පත්වීම් ලිපි ලබාදුන් බවත් ඒවයේ ක්‍රියාත්මක වන දිනය 2014.11.03 දිනය බවද, පත්වීම් භාර ගත් දිනය 2014.11.19 දින බවත් පිළිගනී. තව ද, 07 වන ඡේදය අනුව මෙම ඉල්ලුම්කරුවන් බඳවා ගෙන ඇත්තේ බඳවා ගැනීමේ පටිපාටියේ අදාළ විධිවිධාන කිසිවක් අනුගමනය නොකර බැව් සඳහන් වේ. එසේ නොකිරීම ඉල්ලුම්කරුවන්ගේ වරදක් නොව, වගඋත්තරකරුවන්ගේ ඌණතාවයක ලෙස හැඳින්විය යුතු වේ.

මෙම ඉල්ලුම්කරුවන් හට දෙන ලද පත්වීම් මැතිවරණ කොමසාරිස්තුමාගේ 2014.11.22 දිනැති PRE/2015/43 දරන චක්‍රලේඛයේ 7 (1) වගන්තියට පටහැනි බැව් ලිඛිත දේශනයේ 08 වන වගන්තිය හෙළිදරව් කරයි. තව ද, 09 වන වගන්තිය ප්‍රකාරව මැතිවරණ සමයේ පත්වීම් අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතියෙන් ලබා දිය හැකි බවත්, මැතිවරණ චක්‍රලේඛයන්ට පටහැනිව දෙන ලද ඉහත සඳහන් ඉල්ලුම්කරුවන්ගේ පත්වීම් බල රහිත බැව් වගඋත්තරකරුවන් ප්‍රකාශ කරයි. එහි පත්වීම් බල රහිත නම් ඊට වගකිවයුතු අදාළ සේවකයින් නොව වගඋත්තරකරුවන් යයි මා අදහස් කරමි.

ලිඛිත දේශනයේ 11 වන ඡේදය මෙසේය. ''නීතියට හා සාමාන්‍ය බඳවා ගැනීමේ පටිපාටියට පටහැනිව ශුන්‍ය හා බලරහිත ලෙස ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අනියම් පත්වීම් ලබා සේවය අවසන් කර ඇති ඉහත ඉල්ලුම්කරුවන් මෙම බේරුම්කරණ අධිකරණයට පැමිණීම අසාධාරණ හා අයුක්ති සහගත බව වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් ප්‍රකාශ කර සිටී.'' යනුවෙන් සඳහන් වේ. මේ අනුව පහත කරුණු කෙරෙහි යොමු විය යුතු යයි හඟිමි.

I. චක්‍ර ලේඛනවලට පටහැනිව පත්වීම් ලබා දීමෙන් වගඋත්තරකාර ආයතනය නීතිය ඉදිරියේ වරදක් කර තිබීම,

II. ආයතනයේ සභාපතිවරයා ඇතුළු විධායක නිලධාරීන් පත්වීම් ලබා දීමට සහයෝගය දීම,

III. සේවයට වාර්තා කිරීමට අනුබල දීම,

IV. අනියම් වැටුප් ගෙවීම,

V. පැමිණීමේ ලේඛනයන්ට අත්සන් කිරීමට අවස්ථාව ලබාදීම,

VI. ආයතනයේ සේවක මණ්ඩලයට මෙම සේවකයින් බඳවා ගැනීම හා වැටුප් ගෙවීම,

VII. අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියෙන් තොරව ප්‍රධාන විනය නිලධාරි වන සභාපතිගේ අත්සනින් පත්වීම් ලිපි ලබාදීම,

VIII. ඉහත පියවර සියල්ලම වගඋත්තරකරු විසින් ගන්නා පියවර මිස මෙහි ඉල්ලුම්කරුවන් 13 දෙනාගේ අත්තනෝමතික හෝ බලහත්කාර ක්‍රියා නොවීම.

මෙසේ හෙයින් වගඋත්තරකරු විසින් මෙම ඉල්ලුම්කරුවන් බඳවා ගැනීම හා ඉවත් කිරීම වැරදි ලෙස සිදු කරන ලද නමුත් බඳවා ගැනීමේදී මෙම ඉල්ලුම්කරුවන් වරදක් සිදු නොකර තිබීම යන කරුණු පැහැදිලි වේ.

තවද මෙම සේවක ගැටළුව සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස්වරයා වෙතද වාර්තා කිරීමෙන් අනතුරුව, දෙපාර්ශවය විසින් සැල කරන ලද කරුණු අනුව මෙම සේවකයින් 13 දෙනා සඳහා නැවත රැකියාව දීමට ඇති හැකියාව සලකා බලා ඒ සඳහා කටයුතු කරන මෙන් කම්කරු කොමසාරිස් ජනරාල්තුමා

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක රහිත 2015/12/30 දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයා අමතන ලද ලිපියේ අවසාන ඡේදය මෙසේය. ''මෙදින පැවති සාකච්ඡාවේදී ''පත්වීම් අහෝසි කිරීම (එනම් ඉල්ලුම්කරුවන්ගේ පත්වීම්) විධිමත් ආකාරයෙන් සිදු නොවූ බව එනම් අහෝසි කළ බව දැනුම් දුන් ලිපියේ එසේ කිරීම සඳහා බලපෑ හේතුව සඳහන් වී නොමැති බව දැනුම් දෙන ලදී. එහි සඳහන් වී තිබුනේ පත්වීම් ලිපියේ 03 වන ඡේදයේ සඳහන් කරුණු පදනම් කර ගනිමින් ඔවුන්ගේ පත්වීම් අහෝසි කර ඇති බවයි. මෙම පත්වීම් විධිමත් ආකාරයෙන් ලබා දී නොතිබූ නිසා එනම් මැතිවරණ ප්‍රකාශ කිරීමෙන් පසු කාල සීමාව තුළ ලබා දී තිබූ බැවින් මැතිවරණ දෙපාර්තමේන්තුවේ 2014.11.22 දිනැති චක්‍ර ලේඛය පදනම් කර ගනිමින් පත්වීම් අහෝසි කිරීමට කටයුතු කළ බව පෙනී යයි.'' යනුවෙන් ශ්‍රී ලංකා සංචාරක අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත කරන ලද විස්තර ප්‍රකාශය මඟින් ද, වගඋත්තරකරුවන්ගේ ක්‍රියාදාමය වැරදි සහගත බව හෙළි වේ.

මෙම සේවකයින් 13 දෙනා සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස් ජනරාල්ගේ අංක IR/com/04/E/2015/169 හා 2015.12.30 දිනැති ලිපියේ 2 ඡේදයේ මෙසේ දැක්වේ. ''එම සාකච්ඡාවලදී පාර්ශව විසින් ඉදිරිපත් කරන ලද කරුණු අනුව මෙම සේවකයින් 13 දෙනා සඳහා නැවත රැකියාව ලබා දීමට ඇති හැකියාව සලකා බලා ඒ සඳහා කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.'' යන තීරණයද බේරුම්කරණ විභාගයේදී සැලකිල්ලට ගන්නා ලදී. එනම් දෙපාර්ශවයේ කරුණු සලකා බලා මෙම සේවකයින් 13 දෙනා කෙරෙහි කම්කරු කොමසාරිස්තුමා ස්වකීය තීරණය සාධාරණ ලෙස ගත් බවය.

තවද කම්කරු කොමසාරිස්තුමා ඉදිරියේ පවත්වන ලද 2015.11.12 දින සාකච්ඡාවේදී ''මෙම සේවකයින් සඳහා වැටුප්පත් ලබාදීමක් හා සේවක අර්ධ සාධක මුදල් හා සේවක භාරකාර මුදල් අය කර ගැනීමක්ද, මෙම සේවකයින් ආයතන තුනක, එනම්

1. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය,

2. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය,

3. ශ්‍රී ලංකා හෝටල් කළමනාකරණ ආයතනය තුළ උපරිම කැපවීමෙන් සේවය කළ බවත්, මේ වන තෙක් කිසිදු විනය පරීක්ෂණයක් හෝ කිසිදු චෝදනාවකට බඳුන් වී නොමැති බවත්, දන්වා සිටින ලදී. මෙම සේවකයින් අතර කළමනාකරණ සහකාර සේවකයින් 22ක්, කාර්යාල කාර්ය සහායකින් 4ක් රියදුරු 01ක් වන බවත්, මෙම සේවකයින් සංචාරක මණ්ඩලයට බැඳී ඇත්තේ පුවත්පත් දැන්වීමක් පදනම් කර ගනිමින් බවත්, සම්මුඛ පරීක්ෂණ සඳහා පෙනී සිටි බවත්,'' වැඩිදුර දන්වා සිටී. මෙම පරීක්ෂණයේදී හෙළි වී ඇති ඉහත සඳහන් කරුණු මත සේවකයින් 13 දෙනා සාධාරණ ලෙස කටයුතු කොට ඇති බවත් ඔවුන්ගේ පාර්ශවයෙන් කිසියම් හෝ ඌණතාවයක් නොවූ බවත්, වගඋත්තරකාර පාර්ශවයේ යම් යම් ඌණතා පැවති බවත් කම්කරු කොමසාරිස් ජනරාල්තුමා පවත්වන ලද පරීක්ෂණයේදී හෙළි වී ඇත. ඉහත කරුණු මෙම ඉල්ලුම්කරුවන්ගේ සේවය නැවත ලබාදීමේදී සැලකිල්ලට ගත යුතු වෙතැයි හඟිමි.

තවද කම්කරු කොමසාරිස්තුමාගේ උක්ත අංක හා දින දරන ලිපියේ අවසන් ඡේදය මෙසේය.''කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ ලේකම්තුමන් විසින් දන්වා සිටින ලද්දේ මෙම සේවකයින්ගේ සේවය අත්හිටුවීම නීති විරෝධී ලෙස සිදු කර ඇති බැවින් මේ සම්බන්ධයෙන් ආයතනය දැනුවත් කර මෙම සේවකයින් සඳහා නැවත තනතුරු ලබා දීමට කටයුතු කරන ලෙස කම්කරු කොමසාරිස් ජනරාල්වරයා දැනුම් දුන් බව සඳහන් වේ.''

තවදුරටත් මෙම පරීක්ෂණයේදී සේවක පක්ෂය සඳහන් කර ඇත්තේ සේවක අර්ධ සාධක අරමුදල් අඩු කර ගත් නමුත් ඒවා අරමුදලට බැර කර නොමැති බවත්, තමන් සියළු දෙනා සම්මුඛ පරීක්ෂණයට භාජනය කොට අදාළ පත්වීම් ලබා දුන් බවත්, එකී ලියකියවිලි ඇතැම් විට වගඋත්තරකාර ආයතනයෙන් විනාශ කර තිබෙන්නට ඉඩ ඇති බවත් අදාළ පරීක්ෂණයේදී සේවකයින් කම්කරු කොමසාරිස් ජනරාල්වරයා වෙත පවසා සිටි බවත්, ''පත්වීම් ලබා දීමේදී එම පත්වීම් සඳහා නිසි පරිදි අදාළ අනුමැතිය ලබා තිබේද යන්න පිළිබඳව සේවක පක්ෂය වග කිවයුතු නැති බවත්, සේවා අවශ්‍යතාවයක් නොමැති හෙයින් මෙම සේවකයින් ඉවත් කොට නැවත අනියම් පදනමින් නව සේවකයින් බඳවා ගෙන ඇති බවත්, සේවය අවසන් කරන ලිපියේ අත්සන් කර ඇති අයට ඒ පිළිබඳ බලයක් තිබේද යන්න විමසූ විට ඒ පිළිබඳ තොරතුරු පසුව දන්වන බව වගඋත්තරකාර පාර්ශවය පවසා ඇත. ඊට කරුණු දක්වමින්'' ඒ දිනවල සිටි විධායක නිලධාරි විසින් සේවය අවසන් කරන ලිපිවල අත්සන යොදා ඇති බව සඳහන් කර ඇතත් එකී නිලධාරීන්ට ඊට බලය නැති බවත්, සභාපති ප්‍රධාන විනය නිලධාරි හෙයින් පත්වීම් ලිපිවලට ඔහු අත්සන් කළ යුතු වාක් මෙන්ම සේවය අවසන් කිරීමේ ලිපිවලට ඔහුම අත්සන් කළ යුතු වන හෙයින් සේවය අවසන් කිරීමේ ලිපිවලට වගඋත්තරකරුගේ සභාපතිතුමා පෞද්ගලිකවම අත්සන් යෙදිය යුතු වුවද එසේ සිදු නොවීම මෙම සේවකයින්ගේ සේවය අවසන් කිරීම අවිධිමත් බැව් සඳහන් කළ යුතු වේ.

තවද අමාත්‍ය මණ්ඩල කාර්යාලය ඔවුන්ගේ අංක අමප/16/0379/725/007 හා 2016.05.11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ''සංචාරක අංශයේ ආයතනයන් හා සම්බන්ධ සේවා නියුක්තිකයන් 27 දෙනෙකු අයුතු ලෙස සේවයෙන් පහ කිරීම.'' සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ නිර්දේශය පහත පරිදි වේ. (නඩු ගොනුවේ 43 පිටුව)

''ඉහත සංදේශය සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු ඇමතිතුමාගේ, මුදල් ඇමතිතුමාගේ සහ රාජ්‍ය පරිපාලන හා කළමනාකාර ඇමතිතුමාගේ නිරීක්ෂණ සමඟ සලකා බලන ලදී. කාර්මික ආරාවුල් පනත මඟින් කම්කරු හා වෘත්තීය සමිති සබඳතා ඇමතිතුමා වෙත පැවරී ඇති

බලතල අනුව සංදේශයේ සඳහන් සේවකයින් 27 නැවත සේවයේ පිහිටුවීම සම්බන්ධයෙන් වන ආරාවුල බේරුම්කිරීම මඟින් නිරවුල් කිරීම පිණිස බේරුම්කරුවෙකු වෙත යොමු කොට ඇති බව අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලදී. මේ පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව මේ සම්බන්ධයෙන් බේරුම්කරුගේ අදාළ තීරණය ලැබීමෙන් පසුව මෙම කරුණ පිළිබඳව සලකා බැලීම සුදුසු බව අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ කිරීම නිරීක්ෂණය කරන ලදී.''

මෙම නිරීක්ෂණයෙන්ද අදාළ සේවකයින් මෙම නඩුවේ ඉල්ලුම්කරුවන් 13 දෙනා සේවයෙන් පහකිරීම අයුක්ති සහගත බවට ඉඟියක් පළ කරන්නකි.

තවදුරටත් මෙම නඩුවේ ඉල්ලුම්කරුවන් 13 සම්බන්ධයෙන් ධීවර හා ජලජ සම්පත් ගරු අමාත්‍යතුමාගේ අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 1/4/1/10/1/1C/ppr (08) 2016 හා අමාත්‍ය මණ්ඩල සංදේශයහි ''සංචාරක අංශයේ ආයතනයන් හා සම්බන්ධ සේවා නියුක්තිකයන් 27 දෙනෙකු අයුතු ලෙස සේවයෙන් පහ කිරීම'' යන ශීර්ෂය යටතේ සංචාරක සංවර්ධන අධිකාරිය, සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, සංචාරක හෝටල් කළමනාකාරීත්ව ආයතනය යන ආයතනයන්හි සේවයේ නිරතව සිටි සේවා නියුක්තිකයන් 27 දෙනෙකු අයුතු ලෙස සේවයෙන් පහ කිරීම සම්බන්ධයෙන් මා වෙත කරුණු ඉදිරිපත් කර ඇත. මෙම සේවා නියුක්තිකයන් අනියම් සේවා පදනම යටතේ 2014.11.03 දින සේවයට බඳවා ගෙන ඇති අතර සාධාරණ පදනමකින් තොරව ඔවුන්ගේ සේවය 2015.01.23 දින සිට අවසන් කර ඇත. .................... ඔවුන්ගේ සේවය අවසන් කිරීම අසාධාරණ බව තීන්දු කරමින් ........... මෙය බේරුම්කරණය වෙත යොමු කරවන ලදී.

මෙම තීරණයට පාදක කර ගන්නා ලද්දේ :-

I. ඔවුනට විරුද්ධව විනය විරෝධීවීම, වංකභාවය හෝ දූෂණ පිළිබඳ චෝදනා නොමැති වීම,

II. මොවුන් අනියම් පදනම යටතේ සේවයට බඳවා ගත් නමුත්, සේවය අවසන් කිරීමේ දිනයක් ඔවුන් හෝ පත්වීම් ලිපියේ සඳහන් නොකිරීම,

III. පුවත්පත් මාර්ගයෙන් පළ කරන ලද දැන්වීම් හරහා හා සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව මෙම තනතුරු සඳහා තෝරා පත් කර ගැනීම යන කරුණු හා අදාළ අමාත්‍යාංශ නිලධාරීන් වෙත නිල වශයෙන් දැනුම් දීමට කටයුතු කර තිබීම නිසා මේ පත්වීම් නීත්‍යානුකූල වීම ආදී කරුණු මත බේරුම්කරණය වෙත යොමු කොට ඇති බැව් දක්වේ.

මෙම කරුණු සම්බන්ධයෙන් පවත්වන ලද විමර්ශනයට අනුව අදාළ තනතුරු සම්බන්ධ පුවත්පත් පළ කරන ලද සුදුසුකම් අවශ්‍යතා මෙම විසිහත් දෙනාගෙන් දෙදෙනෙකු හැර අනෙක් සියළු දෙනා සපුරා ඇත.

**යෝජනාව**

''ඉහත සඳහන් කරුණු සලකා බැලීමේදී ඉහත කී සේවය අත්හිටුවීම සාධාරණ නොවන බවත්, ඒ අනුව ඔවුන් නැවත සේවයේ පිහිටුවීම සුදුසු බවත් පැහැදිලි වේ.''

**අනුමැතිය**

''මෙම සේවා නියුක්තිකයන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද සලකා බැලීමෙන් ඔවුන් නැවත සේවයේ පිහිටුවන ලෙස අදාළ ආයතන 03 වෙත උපදෙස් නිකුත් කරන මෙන් ඉල්ලා සිටිමි.'' යනුවෙන් ගරු ධීවර හා ජලජ අමාත්‍යතුමා සිය ලේඛනයේ සඳහන් කර ඇත. ලිපි අවසානයේ අමාත්‍යතුමාගේ අත්සන හා 2016.02.26 දිනය යොදා ඇත. නඩු ගොනුවේ 44 හා 45 පිටු.

ඉහතින් සඳහන් කරන ලිපිවලින්ද මෙම ඉල්ලුම්කරුවන් 13 දෙනා සේවයෙන් ඉවත් කිරීම අසාධාරණ බව හෙළි කර ඇත.

මෙම ප්‍රදානය ලබාදීමේදී මීට පෙර සඳහන් කළ කරුණුවලට අමතරව තවදුරටත් ඉල්ලුම්කරුවන්ගේ වාසියට පහත කරුණුද ඉදිරිපත් කරමි.

1. සාමාන්‍ය බඳවා ගැනීමේ පටිපාටියට පටහැනිව 2014 නොවැම්බර් මාසයේදී පළමු පාර්ශවකරුවන් බඳවා ගැනීම සිදු කළේ නම් ඒ වගඋත්තරකාර පාර්ශවය බව,

2. ''ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අනියම් කළමනාකාර සහකාර තනතුරට 2014 නොවැම්බර් මස 03 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔබ පත් කරමි.'' යන්නෙන් පත්වීම් ලිපි ලබා දී ඇති හෙයින් එදින සිට සේවය බලාත්මක වන හෙයින්ද,

3. වගඋත්තරකාර ආයතනයේ බඳවා ගැනීම් පටිපාටියට බැහැරව වෙනත් ක්‍රම ඔස්සේ නව බඳවා ගැනීම් සිදු කිරීම වගඋත්තරකරුවන්ගේ වරදක් මිස ඉල්ලුම්කාර පාර්ශවයේ වරදක් නොවන හෙයින්ද,

4. මැතිවරණ කොමසාරිස්ගේ 2014.11.22 දිනැති PRE/2015/43 චක්‍ර ලේඛයේ 7(1) වගන්තියට පටහැනිව පළමු පාර්ශවයට පත්වීම් ලබාදී ඇති බවට වගඋත්තරකරුවන්ගේ තීරණය සාවද්‍ය වේ. හේතුව ඉල්ලුම්කරුවන්ගේ පත්වීම් බලාත්මක වන දිනය 2014.11.03 දිනය වන හෙයින්ද,

5. ඉල්ලුම්කරුවන්ගේ පත්වීම් ලිපිවලට භාෂ්වර සේනාංක ගුණරත්න යන ආයතනයේ සභාපතිවරයා විනය බලධරයා ලෙස අත්සන් කොට ඇති අතර එය බලාත්මක වුවද, සියළු තනතුරු 2015.01.20 දින අහෝසි කිරීම සඳහා විනය බලධරයා වෙනුවට අත්සන් යොදා ඇත්තේ ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අපැහැදිලි අත්සන යොදමිනි. නම පැහැදිලි නොවේ. එය විනය බලධරයා වන සභාපති විසින් කළ යුත්තකි. පත්කිරීම, අස්කිරීම, මාරු කිරීම, විනය චෝදනා පත්‍රයට අත්සන් කිරීම ආදී කටයුතු විනය බලධරයා විසින් සිය අත්සනින් බලය දිය යුතු වේ. මෙහි තනතුර අහෝසි කිරීමේදී අධ්‍යක්ෂ ජනරාල්වරයා අත්සන යෙදීම විනයානුකූල නොවන සිද්ධියකි. එයද මෙහිදී සැලකිල්ලට ගත යුතු කරුණකි.

දීර්ඝ වශයෙන් සාකච්ඡාවට භාජනය කරන ලද ඉහත කරුණු සමූහය කැටි කොට ගත් කළ මෙම බේරුම්කරණයේ ඉල්ලුම්කරුවන් 13 අතුරින් විභාගයට මුහුණ දුන් ඉල්ලුම්කරුවන්ගේ නියෝජිත තැන විසින් ප්‍රකාශිතවම සඳහන් කරන ලද පහත අයවලුන් වගඋත්තරකාර පාර්ශවයේ 2018.10.26 දිනැති ලිඛිත දේශනය මහින්ද ප්‍රදානයේ ප්‍රතිලාභ ලබා දිය යුතු වන්නේ පහත සඳහන් අය කෙරේ මිස යොමුවේ සඳහන් ඉල්ලුම්කරුවන් 13 දෙනාම වෙත නොවේ.

එනම් :- 1. ඩබ්ලිව්. එල්. පී. ඉමාලි මහේෂනී
2. එච්. ලක්ෂානි වීරතුංග
3. වී. කේ. ඩී. බණ්ඩාර
4. ටී. එන්. විතාරණ
5. එන්. ඒ. ශ්‍රියාසිංහ (ඇටෝර්නි බලකරු වන ඇයගේ මව)

දෙවන පාර්ශවයේ 2018.10.26 දිනැති ලිඛිත දේශනයේ පහත කරුණු කෙරෙහි ද ප්‍රදානය ලබා දීමේ දී සැලකිල්ලට ගන්නා ලදී.

(අ) ලිඛිත දේශනයේ 13 වන ඡේදයෙහි සඳහන් මැතිවරණ චක්‍ර ලේඛ පටහැනිව හා බඳවා ගැනීමේ පටිපාටිවලට පටහැනිව පළමු පාර්ශවයේ සේවකයින් බඳවා ගැනීම් සිදු කොට ඇති හෙයින් ඔවුන්ගේ පත්වීම් 2015.01.20 දින ලිපියක් මගින් ඉල්ලුම්කරුවන්ගේ තනතුරු අහෝසි කළ බව, එහෙත් බඳවා ගැනීම් සිදු කර ඇත්තේද තනතුරු අහෝසි කොට ඇත්තේද මෙම බේරුම්කරණයේ ඉල්ලුම්කරුවන් නොව වගඋත්තරකරු විසින් බව,

(ආ) සේවය අහෝසි කොට ඇත්තේ විනය බලධරයා නොව ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා බව එය බලාතික්‍රමණ (Wega vives) ක්‍රියාවක් බව,

(ඇ) 15 වන ඡේදයේ පත්වීම් භාරගත් දිනය ලෙස 2014.11.9 යන්න සඳහන්ව ඇත. (A/12/2018 ගොනුවේ පිටු අංක 71)

(ඈ) දෙවන පාර්ශවය තමාට පැවරී ඇති බලය ඉක්මවමින් ගන්නා ලද තීරණයක් (Ultra vives) නීතියට පටහැනි වන හෙයින්ද, දෙවන පාර්ශවය පළමු පාර්ශවයේ ඊනියා පත්වීම් නීත්‍යානුකූලව අවසන් කළ බව දෙවන පාර්ශවය පිළි ගනී. දෙවන වගඋත්තරකාර පාර්ශවයේ පත් කිරීම් හා තනතුරු අහෝසි කිරීම ඉල්ලුම්කරුවන් විසින් ගත් ක්‍රියාමාර්ගයක් නොව වගඋත්තරකරු විසින් ගත් පියවරක් බව,

(ඉ) Ragupathi Upulwan Senasighe නඩුව හා Sirisena and others vs HSRB Kobbekaduwa යන නඩු දෙකම දෙවන පාර්ශවයේ වාසියට නොව ඉල්ලුම්කරුවන්ගේ වාසියට පවත්නා නඩු බව,

මෙම ලිඛිත දේශනයෙහි අවසාන ඡේදය මෙසේය. එනම්,

(111) ''නීතියට හා සාමාන්‍ය බඳවා ගැනීමේ පටිපාටියට පටහැනිව ශූන්‍ය හා බල රහිත ලෙස ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අනියම් පත්වීම් ලබා සේවය අවසන් කර ඇති ඉහත ඉල්ලුම්කරුවන් මෙම බේරුම්කරණ අධිකරණයට පැමිණීම අසාධාරණ හා අයුක්ති සහගත බවත්ය.''

යන සම්ප්‍රකාශය හා ලිඛිත දේශනය තුළ පවත්නා අනෙකුත් කරුණු අනුව මෙම බේරුම්කරණයේ ඉල්ලුම්කරුවන් පස් (05) දෙනා මෙම පත්වීම් බලහත්කාරයෙන් ලබා ගත් ඒවා නොවන බවද ඒවා වගඋත්තරකරුගේ බලධාරීන් විසින් පත් කොට බලය ලබා දුන් ඒවා බවද ඒ සම්බන්ධව ඔවුන් තවදුරටත් දඬුවම් ලැබිය යුතු නොවන බවද සලකමි.

ප්‍රදානය

ඒ අනුව මෙම බේරුම්කරණ නඩුවේ ප්‍රදානය පහත අයවලුන් හට පමණක් වලංගු වන පරිදි ප්‍රකාශ කරමි. එනම්

1. ඩබ්ලිව්. එල්. පී. ඉමාලි මහේෂිනී
2. එච්. ලක්ෂානි වීරතුංග
3. වී. කේ. ඩී. බණ්ඩාර
4. ටී. එන්. විතාරණ
5. එන්. ඒ. ශ්‍රියාසිංහ යන අයයි.

මෙම අයවලුන්ගේ සේවය අවසන් කරන ලද දිනයේ සිට හිඟ වැටුප් සහිතව අඛණ්ඩ සේවයේ පිහිටුවන ලෙසද දෙවන පාර්ශවයට නියෝග කරමින් ප්‍රදානය ලබා දෙමි. මෙම ප්‍රදානය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බැව් සහතික කරමි.

බේරුම්කරු.

දිනය :- 2019 ජනවාරි මස 01 වැනි දින

05-38

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.